OL/2015/40-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | | |
|---|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** | **පැය තුනයි** |
| சங்கீதம் (கீழைத்தேய) | **I, II** | மூன்று மணித்தியாலம் |
| Music (Oriental) | **I, II** | *Three hours* |

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන නිර්දේශිත රාගය කුමක් ද?
(1) බිලාවල් (2) කාෆි (3) යමන් (4) භීම්පලාසි

**2.** ඖඩව - ෂාඩව - සම්පූර්ණ යන රාග ජාති තුනට අයත් ස්වර සංඛ්‍යා පිළිවෙළ තෝරන්න.
(1) 5 - 6 - 7 (2) 6 - 7 - 5 (3) 7 - 5 - 6 (4) 6 - 5 - 7

**3.** භීම්පලාසි රාගයේ ආරෝහණයේ දී වර්ජිත ස්වර දෙක කුමක් ද?
(1) ස සහ ම (2) රි සහ ප (3) රි සහ ධ (4) ම සහ නි

**4.** රාත්‍රී ප්‍රථම ප්‍රහර තුළ ගැයීමට සුදුසු රාගය තෝරන්න.
(1) භූපාලි (2) කාෆි (3) ඛමාජ් (4) බිලාවල්

**5.** රාත්‍රී 9.00 - රාත්‍රී 12.00 අතර කාලයෙන් දැක්වෙනුයේ,
(1) රාත්‍රී ප්‍රථම ප්‍රහරයයි. (2) රාත්‍රී දෙවන ප්‍රහරයයි.
(3) රාත්‍රී තෙවන ප්‍රහරයයි. (4) රාත්‍රී සිව්වන ප්‍රහරයයි.

**6.** ඛමාජ් රාගයට අදාළ ස්වර ඛණ්ඩය තෝරන්න.
(1) ගමපධනිස්නිධ (2) ගමපධනි̲ස්නිධ (3) ගමපධනිස්නි̲ධ (4) ගමපධනි̲ස්නි̲ධ

**7.** භෛරවී රාගයේ විවාදි ස්වර ලෙස භාවිත කළ හැකි ස්වර හතර තෝරන්න.
(1) ස ග ම ධ (2) රි ග ප නි (3) රි ග ධ නි (4) ග ප නි ස්

**8.** 'ස රි ම ප නි' යන ස්වර පහ පිළිබඳ නිවැරදි කියමන තෝරන්න.
(1) බිලාවල් රාගයේ අනුවාදි ස්වර වේ. (2) ඛමාජ් රාගයේ ආරෝහණ ස්වර වේ.
(3) භූපාලි රාගයේ ප්‍රකෘති ස්වර වේ. (4) භීම්පලාසි රාගයේ මුඛ්‍යාංග ස්වර වේ.

**9.** ජප් තාලයෙහි 'තීනා' යන අවනද්ධාක්ෂර සහිත විභාගයට අයත් තාල සංකේතය කුමක් ද?
(1) × (2) 0 (3) 2 (4) 3

**10.** බිලාවල් සහ කාෆි යන රාග දෙකට ම අදාළ පොදු ලක්ෂණය තෝරන්න.
(1) රාග දෙක ම අයත් වනුයේ එක ම මේලයකට ය.
(2) රාග දෙක ම ගැයෙනුයේ එක ම ගාන සමයක ය.
(3) රාග දෙක ම අයත් වනුයේ සම්පූර්ණ ජාතියට ය.
(4) රාග දෙකෙහි ම වාදි ස්වරය වනුයේ ධෛවතය ය.

[දෙවැනි පිටුව බලන්න

**11.** "නිරි ගරි නිරි සස | නිධ නිරි ගරි ස–" යන තානාලංකාරය අයත් වනුයේ,

(1) බිලාවල් රාගයට ය. (2) භූපාලි රාගයට ය. (3) භීම්පලාසි රාගයට ය. (4) යමන් රාගයට ය.


**12.** ස්වර සප්තකයට අයත් අචල ස්වර හා චල ස්වර සංඛ්‍යා පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?

(1) 01 සහ 06 (2) 02 සහ 05 (3) 03 සහ 04 (4) 04 සහ 03

**13.** අනුතත් (තරෆ්) රහිත තත් වාද්‍ය භාණ්ඩය තෝරන්න.

(1) එස්රාජ් (2) දිල්රුබා (3) සිතාර් (4) වයලින්

● අංක **14** සිට **18** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන ඇසුරු කරගන්න.




**14.** සාමාන්‍ය බටනලාවක සිදුරු හය ම වසා පිඹින විට නිකුත් වන ස්වරයට හිමි අංකය තෝරන්න.

(1) 5 (2) 8 (3) 14 (4) 15

**15.** සිතාරයේ ප්‍රධාන තත සුසර කරන ස්වරයට හිමිවනුයේ කිනම් අංකය ද?

(1) 1 (2) 8 (3) 15 (4) 20

**16.** ඛමාජ් රාගයේ අවරෝහණයේ දී පමණක් යෙදෙන ස්වරයකට හිමි අංකය කුමක් ද?

(1) 3 (2) 5 (3) 8 (4) 10

**17.** අංක 11 සහ 18 යන ස්වර දෙක සහිත මේලය තෝරන්න.

(1) බිලාවල් (2) කාෆි (3) ඛමාජ් (4) යමන්

**18.** මධ්‍ය සප්තකයේ ආරම්භක ස්වරය සහ අවසාන ස්වරය පිළිවෙළින් දැක්වෙන්නේ කෙසේ ද?

(1) 1 සහ 8 (2) 5 සහ 13 (3) 8 සහ 19 (4) 10 සහ 20

**19.** දීප්චන්දි තාලයට බෙහෙවින් ම සමානතාවක් දැක්වෙන දේශීය තිත් තාල රූපය තෝරන්න.

(1) මහ තනි තිත (2) සුළු-මැදුම් දෙතිත (3) සුළු-මහ දෙතිත (4) මැදුම්-මහ දෙතිත

**20.** පහතරට සින්දු වන්නමකට අයත් ආරම්භක ගී පාදය කුමක් ද?

(1) සඳවා සුදු වැලි පිවිතුරු
(2) අප ගුණ සරු සිංහල භූපති
(3) සේවිත පාද සරෝරුහ සංජීතයෙන් ඉතා
(4) රන් රසා සේම වඩන වන් යසා රූප දිලෙන

**21.** සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් වන්නම තෝරන්න.

(1) ගජගා වන්නම (2) කෝකිල වන්නම (3) නෛයඩි වන්නම (4) උකුසා වන්නම

**22.** 'පැල් ගී, කමත් ගී, බඹර ගී, ගොයම් ගී' යන ගී වර්ග හතරට ම පොදු කියමන තෝරන්න.

(1) ගී වර්ග හතර ම ආසාතාත්මක ය. (2) ගී වර්ග හතර ම අනාසාතාත්මක ය.
(3) ගී වර්ග හතර ම මෙහෙ ගී ය. (4) ගී වර්ග හතර ම සමාජ ගී ය.

**23.** මැදුම් තනි තිතට අනුව ගැයීමට සුදුසු ගැමි ගී පාදය තෝරන්න.

(1) බුද්ධං සරණේ සිරස දරාගෙන (2) රන් දැකැති ගෙන නිති සැරසෙනවා
(3) අතට වෙරළු ඇහිඳ ගෙනේ (4) රන් ගිරගින් දිළි පුන් සඳ කිරණෙව්

- අංක **24** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ජන ගී පාදය ඇසුරු කර ගන්න.


**"මෝරා බිජයෙනා"**

**24.** ඉහත ගී පාදයට අයත් සඳැස්මත් සංඛ්‍යාව කීය ද?
(1) 6 (2) 8 (3) 10 (4) 12

**25.** එම ගී පාදය ගැයීමේ දී දීර්ඝතම යතියක් පිහිටන අක්ෂරය තෝරන්න.
(1) මෝ (2) රා (3) බී (4) නා

**26.** ඉහත ගී පාදයේ නාදමාලාව ඇසුරෙන් නිර්මිත සරල ගීය තෝරන්න.
(1) රුක් අත්තන මල මුදුනේ (2) ආදරයේ උල්පත වූ අම්මා
(3) සිරිය මෙ සාරා නැගෙව් හද මෝරා (4) තෙදිනි විරාජ රුවිනි විරාජ

- අංක **27** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන් ඇසුරු කර ගන්න.



*A* *B* *C* *D*

**27.** "ගල්ලෙන බිඳලා - ලෙන් දොර ඇරලා" යන ගීය සඳහා වැයීමට සුදුසු කිනම් භාණ්ඩය ද?
(1) *A* (2) *B* (3) *C* (4) *D*

**28.** පංචතූර්ය වාදනයේ දී විතත ගණයට ගැනෙන භාණ්ඩය තෝරන්න.
(1) *A* (2) *B* (3) *C* (4) *D*

**29.** තිසරා වන්නම සඳහා වාදනයට සුදුසු භාණ්ඩය තෝරන්න.
(1) *A* (2) *B* (3) *C* (4) *D*

**30.** "ගම්වල සැම තැන ඇවිද ගොසින්නේ" යන ගීය සඳහා වාදනයට සුදුසු කිනම් භාණ්ඩයක් ද?
(1) *A* (2) *B* (3) *C* (4) *D*

**31.** නව නාට්‍ය රංග සම්ප්‍රදායට අයත් ගීත යුගලය තෝරන්න.
(1) ජීවන මේ ගමන සංසාරේ - ප්‍රේමයෙන් මන රංජිත වේ
(2) ප්‍රේමයෙන් මන රංජිත වේ - දී කිරි දී කිරි ගෙනාව දී කිරි
(3) දී කිරි දී කිරි ගෙනාව දී කිරි - ලෝනා මුණි රාජගේ
(4) ලෝනා මුණි රාජගේ - සත් සියක් කපු මල් රැගෙන මම

**32.** "රඝුපති රාඝව රාජා රාම්" නමැති ප්‍රචලිත ගීය අයත් වනුයේ,
(1) භජන් ශෛලියට ය. (2) තුම්රි ශෛලියට ය.
(3) නාඩගම් ශෛලියට ය. (4) ගසල් ශෛලියට ය.

**33.** අවග්‍රහයෙන් ගැයීමට සුදුසු ම ගීතය තෝරන්න.
(1) සුවඳ පද්ම ඔලු ආදී (2) දුර පෙනෙන තැනිතලා
(3) ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් (4) දන්නෝ බුදුන්ගේ

**34.** නාදයේ ත්‍රිවිධ ගුණ, විද්‍යාවේ දී හැඳින්වෙනුයේ,
(1) ධ්වනි ගුණය - තරංග - සංඛ්‍යාතය වශයෙනි.
(2) තාරතාව - කම්පනය - තරංග වශයෙනි.
(3) විපුලතාව - තාරතාව - ධ්වනි ගුණය වශයෙනි.
(4) කම්පනය - විපුලතාව - සංඛ්‍යාතය වශයෙනි.

**35.** ශබ්දය අඩු වැඩි කර ගැනීම සඳහා උපයෝගී කර ගනු ලබන උපකරණය තෝරන්න.
(1) මික්සර් (MIXER) (2) ඇම්ප්ලිෆයර් (AMPLIFIER)
(3) ස්පීකර් (SPEAKER) (4) මයික්‍රොෆෝන් (MICROPHONE)

53146

**36.** ස. රි ග ග | ග - ග - | ම ග ම ග | ම ග රි -
යන ස්වර පාදය මධ්‍යම භාවයෙන් දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | රි ග ම ම | ම - ම - | ප ම ප ම | ප ම ග - |
| (2) | ග ම ප ප | ප - ප - | ධ ප ධ ප | ධ ප ම - |
| (3) | ම ප ධ ධ | ධ - ධ - | නි ධ නි ධ | නි ධ ප - |
| (4) | ප ධ නි නි | නි - නි - | ස̇ නි ස̇ නි | ස̇ නි ධ - |

**37.** 'අශෝකමාලා' චිත්‍රපටයේ ගී තනු නිර්මාණය කළේ,
(1) ආචාර්ය පණ්ඩිත් අමරදේව සූරීන් ය.
(2) සුනිල් සාන්ත සූරීන් ය.
(3) ආනන්ද සමරකෝන් සූරීන් ය.
(4) මොහොමඩ් ගවුස් සූරීන් ය.

**38.** බටහිර සංගීතයේ ඇල්ටෝ (Alto) යන හඬතලය මතු වන සංගීත භාණ්ඩය කුමක් ද?
(1) වයලින්
(2) ඩබල් බේස්
(3) වියෝලා
(4) චෙලෝ

**39.** සමාඝාත (Percussion) යනුවෙන් නම් කෙරෙන සංගීත භාණ්ඩ සමූහය තෝරන්න.
(1) ජල තරංග - පියානෝ - එකෝඩියන්
(2) ඔක්ටොපෑඩ් - සයිලෆෝන් - ග්ලොකන්ස්පීල්
(3) සයිලෆෝන් - ග්ලොකන්ස්පීල් - ජල තරංග
(4) එකෝඩියන් - ඔක්ටොපෑඩ් - පියානෝ

**40.** අපරදිග සංගීතඥ බීතෝවන් නිර්මාණය කළ 'කෝරල් Number (9) ' සංධ්වනිය (Symphony) තුළ ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත්තේ,
(1) අවනද්ධ භාණ්ඩ සඳහා ය.
(2) මිනිස් කටහඬ සඳහා ය.
(3) තත් භාණ්ඩ සඳහා ය.
(4) සුෂිර භාණ්ඩ සඳහා ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iii) තෙක් සඳහන් ව ඇති තොරතුරු නිවැරදි නම් '√' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද ප්‍රශ්න අංකය ලියා ඉදිරියේ සටහන් කරන්න.

(i) බිලාවල් රාගයේ වාදි-සංවාදි ස්වර වනුයේ පිළිවෙළින් ධෛවතය සහ ගාන්ධාරයයි.

(ii) උච්ච ෂඩ්ජය (සං) ස්වරයට නියමිත කම්පන වාර සංඛ්‍යාතය 256කි.

(iii) 'සබේ විදානේ' චරිතය ඇතුළත් වනුයේ කෝලම් සම්ප්‍රදායේ ය.

- අංක (iv) සිට (vi) තෙක් හිස් තැන්වලට සුදුසු ම පිළිතුරු වරහන් තුළින් තෝරා ගෙන ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ඩබ්ලිව්. බී. මකුලොළුව සූරීන්, ආචාර්ය ප්‍රේමසිරි කේමදාස සූරීන්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්)

| නිර්මාණය | නිර්මාතෘ |
|---|---|
| මානස විල | (iv) .................................................... |
| සිංහබාහු | (v) .................................................... |
| දෙපාණෝ | (vi) .................................................... |

- පහත හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයෙහි පිළිවෙළින් ලියන්න.

(vii) තබ්ලාවේ නිර්මාතෘවරයා ලෙස හැඳින්වනුයේ .................................................. පඬිතුමා ය.

(viii) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා ප්‍රවීණත්වය ඉසිලූ වාද්‍ය භාණ්ඩය .................................................. වේ.

(ix) "ශ්‍රී ලංකා මා ප්‍රියාදර ජය භූමි" (සැඩ සුළං) චිත්‍රපට ගීය .................................................. විසින් ගයනු ලැබූ අතර "රැජින මමයි අපේ රාජ්ජේ" (සංදේශය) චිත්‍රපට ගීය ගයනු ලැබුවේ .................................................. විසිනි.

(x) අල්හාජ් මොහිදීන් බෙග් සූරීන් ගැයූ "සුව දේ මට සීතල සුළඟ පවා" ගීය ඉන්දියානු .................................................. ගායන ශෛලියට සම්බන්ධ වන අතර, එම්. එස්. ප්‍රනාන්දු සූරීන් ගැයූ "රස ආහර කවලා" ගීය .................................................. සංගීතයට අනුගත ය.

**2.** පහත දැක්වෙන්නේ රාගධාරී තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| | රාගය | මේලය | ආරෝහණ | අවරෝහණ | වාදි-සංවාදි | රාග ජාතිය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|
| A | (i) ......... | (ii) ............ | සරිගමපධනිසං | සංනිධපමගරිස | (iii) ......... | සම්පූර්ණ | (iv) ............ |
| B | (v) ......... | කාෆි | (vi) ............ | සංනිධපමගරිස | (vii) ......... | ඖඩව සම්පූර්ණ | (viii) ............ |
| C | (ix) ......... | කල්‍යාණ | සරිගපධසං | (x) ............ | ග, ධ | (xi) ............ | (xii) ............ |

(i) ඉහත වගුව සම්පූර්ණ කිරීම සඳහා හිස්තැනෙහි ඇති රෝම ඉලක්කම ද අදාළ පිළිතුර ද ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ii) A හෝ C රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) B තීරුවේ සඳහන් මේලයට ම අයත් නිර්දේශිත වෙනත් රාගයක් නම් කර, එහි ආරෝහණ, වාදි, සංවාදි ලියන්න.

[හයවැනි පිටුව බලන්න

**3.** පහත දැක්වෙන තොරතුරු අනුව ගොඩනැගෙන නිර්දේශිත හින්දුස්ථානි තාල **හතර** හඳුනා ගන්න.

(a) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ සිව්වන මාත්‍රාවෙහි ය.

(b) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ පස්වන මාත්‍රාවෙහි ය.

(c) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ සයවන මාත්‍රාවෙහි ය.

(d) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ අටවන මාත්‍රාවෙහි ය.

(i) ඉහත තාල **හතරෙහි** නම් පිළිවෙළින් ලියන්න.

(ii) (c) හා (d) තාල දෙකෙන් **එක්** තාලයකට අයත් ඨේකාව, නියමිත තාල සංකේත සහිත ව ප්‍රස්තාර කරන්න.

(iii) මාත්‍රා 16කින් හා විභාග 4කින් යුත් නිර්දේශිත තාලයක් නම් කර, එය මත පදනම් වූ නිර්දේශිත මධ්‍යලය බඩාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක අන්තරා කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iv) ඉහත (iii) කොටසින් හැඟවෙන තාලය වැයීමේ දී තබ්ලාවෙහි දායාවෙන් (දහිනා) පමණක් වැයෙන අවනද්ධාක්ෂර නම් කරන්න.

**4.** පහත දැක්වෙනුයේ 'ගැමි ගී' සහ 'සෙ ගී' කිහිපයකට අයත් මුල් ගී පාදයන් ය.

- මන මත් කරවන දන මුළු දෙරණා
- ඉපිද එ බෝසත් නා ලොව වාරෙක
- තෙල් ගාලා හිස පීරන් නෑනෝ
- තුරු රත්න සිරි ලෙසිනා
- බුද්ධං සරණේ සිරස දරා ගෙන
- පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
- අහසට පිඹිනා එරන් කළේ යා
- රන් දැකැති ගෙන නිති සැරසෙනවා

(i) ඉහත ගී පාද 'ගැමි ගී' හා 'සෙ ගී' යටතේ වර්ග කරන්න.

(ii) ගැමි ගී හා සෙ ගී පිළිබඳ විශේෂ ලක්ෂණ **හතර** බැගින් ලියා දක්වන්න.

(iii) "බුද්ධං සරණේ සිරස දරාගෙන" යන ගී පාදය ගැයෙන තිත් රූපය නම් කර, ඊට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

(iv) එම ගී පාදය ඉහත තිත් රූපය අනුව තාලානුකූල ව පද ප්‍රස්තාර කරන්න.

**5.** (i) ආනන්ද සමරකෝන් සූරීන් සහ සුනිල් සාන්ත සූරීන් යන දෙදෙනාගෙන් **එක්** සංගීතඥයකුගේ සංගීත මෙහෙවර කරුණු **හතරක්** යටතේ උදාහරණ සහිත ව විස්තර කරන්න.

(ii) ග්‍රැමෆෝන් තැටි ගී යුගය පිළිබඳ ඔබ දන්නා තොරතුරු **හතරක්** ලියන්න.

(iii) ග්‍රැමෆෝන් ගී සඳහා ගායනයෙන් දායක වූ **තිදෙනෙකුගේ** නම් ද, ඔබ දන්නා ඕනෑම ග්‍රැමෆෝන් ගීත **තුනක** මුල් ගී පාදය බැගින් ද ලියා දක්වන්න.

**6.** ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලීන් දෙකකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.


- දකුණු ඉන්දියානු සංගීතාභාසය ලැබී ඇත.
- ශාලාවක් තුළ වේදිකාගත වේ.
- "වාසනා දිනේකි මේක" මෙම ශෛලියට අයත් ප්‍රචලිත ගීයකි.
- මද්දල දෙකකින් අඩු තාල් වැඩි තාල් වාදනය කෙරේ.
- මෙම රංග ශෛලියේ ගීත සඳහා තබ්ලාව වාදනය කෙරේ.
- තිර්ලානා පසන් වඩිමුඩි වැනි තාල භාවිත කෙරේ.
- "ගම්භීර තෙදැති කොන්ස්තන්තීනු පුරේ" මෙම රංග ශෛලියේ ප්‍රචලිත ගීයකි.
- නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ නාමය මෙම රංග ශෛලිය හා බද්ධ ව පවතී.

(i) උක්ත රංග ශෛලීන් **දෙක** නම්කර ඒ ඒ ශෛලිය යටතේ අදාළ ඉහත තොරතුරු වෙන වෙන ම වගුගත කරන්න.

(ii) මෙම එක් එක් රංග ශෛලියට අදාළ නිෂ්පාදනයක් ගීතයක් හා සංගීතඥයෙක් බැගින් නම් කරන්න.

(iii) මෙම රංග ශෛලීන් දෙක පිළිබඳ ව ඒවායේ නාට්‍යමය හා සංගීතමය ලක්ෂණ පිළිබිඹු කෙරෙන කරුණු **පහක්** සංසන්දනාත්මකව ලියා දක්වන්න.

**7.**



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය, පෙරදිග සංගීත ක්‍රමයට අනුව තාලානුකූල ව ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) එම පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට පෙරළා නැවත ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයෙහි නොමැති Flat, Sharp, Tie, Rest mark, Bass clef, Semibreve යන අපරදිග ස්වර සංකේත දළ රූප සටහන් මගින් පෙන්වන්න.

(iv) 'අපරදිග සංගීත සංධ්වනි' යන්න පිළිබඳ කරුණු **පහක්** යටතෙහි විස්තරයක් කරන්න.

* * *